# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/43 - 2016 නොවැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)



# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/2015

**කාර්මික ආරාවුල් පනත (131 වන අධිකාරය)**

(131 වන අධිකාරය වූ) 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වැනි වගන්තිය මගින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එම අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1959 මාර්තු මස 02 වැනි දින අංක 11688 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ කලින් කල සංශෝධිත වූ ද, 2008 මාර්තු මස 28 වැනි දින අංක 1542/35 *ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධිත වූ ද, 1958 කාර්මික ආරාවුල් නියෝගවල දෙවන උපලේඛනයේ 2 වැනි ජේදය, ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''02 - මෙහි මින්මතු සඳහන් වන විධිවිධානවලට යටත්ව යම් බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ නිලධරයකු නොවන්නේ නම්, එම තැනැත්තාට :-

(1) පහත දැක්වෙන අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන ගාස්තුවක් රැස්වීම් වාරවලට පැමිණීම සඳහා ලබාගැනීමට හිමිකම් ඇත්තේ ය. -

(*අ*) යම් රැස්වීම් වාරයක කාල සීමාව පැය එකක් නොඉක්මවන්නේ නම්, එම රැස්වීම් වාරය සඳහා රු.1,000/-;

(*ආ*) යම් රැස්වීම් වාරයක කාල සීමාව පැය එකකට වැඩි නම් සහ පැය තුනක් නොඉක්මවන්නේ නම්, එම රැස්වීම් වාරය සඳහා රු.1,500/- ; සහ

(*ඇ*) යම් රැස්වීම් වාරයක කාල සීමාව පැය තුනක් ඉක්මවන්නේ නම්, එම රැස්වීම් වාරය සඳහා රු.2,000/-;.

එසේ වුව ද, බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක සාමාජිකයකු එක් කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් රැස්වීම් වලට පැමිණ සිටීම සඳහා ලබා ගැනීමට හිමිකම් ඇති උපරිම මුදල රුපියල් 25,000/- කි.

(2) බේරුම්කරණ ප්‍රදානය ලිවීම වෙනුවෙන් -

(*අ*) රු.5,000/- ක දිරි දීමනාවක් ; සහ

(*ආ*) එම ප්‍රදානය එම ආරාවුල විභාග කොට අවසන් කිරීමෙන් පසු සති හයක් ඇතුළත භාරදෙනු ලබන්නේ නම්, රු.5,000/- ක අතිරේක ගාස්තුවක් ;

ලබාගැනීමට හිමිකම් ඇත්තේ ය.''

11 - 1117